මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம
Department of Education,Central Province

කාර්යාලය / அலுவலகம் / Office 081 - 2224041 / 081 - 2224042

විද්‍යුත් තැපැල / மின் அஞ்சல / E mail pdcentralprovince@gmail.com

ජාතික ඵලදායිතා සම්මාන 2016 /2017 අන්තර් දෙපාර්තමේන්තු කාණ්ඩය දෙවන ස්ථානය

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / மா.க.பணிப்பாளர் 081-2225134 / Provincial Director of Education

අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) / மே.மா.க.பணிப்பாளர் (நிர்வாகம்) 081 - 2224041 / Additional Provincial Director of Education.(Admin)

අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (මුදල්) / மே.மா.க.பணிப்பாளர் (நிதி) 081-2223343 / Additional Provincial Director of Education.(Finance)

මගේ අංකය / எனது இல / My No: මප/අධ්‍යා/සාපා/20/ගුරුමාරු

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date 2026.06.16

වැදගත් :- සියලුම විදුහල්පතිවරුන්ට (සිංහල හා දෙමළ මාධ්‍ය) ගුරු මාරු ඉල්ලුම් පත්‍ර දෙකක් සහ මෙම උපදෙස් පත්‍රිකාවේ පිටපතක් ලබා දිය යුතුය.

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා විදුහල්පතිවරුන් වෙත,

**ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම - 2027**

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති අධ්‍යාපන ලේකම්ගේ අංක ED/1/27/1/5/1/2007 හා 2007-12-13 දිනැති 2007/20 අංක දරණ ගුරු මාරු චක්‍රලේඛය අනුව සහ ජාතික ගුරු මාරු චක්‍රලේඛයට අනුකූලව සකස් කරන ලදුව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2024.06.04 දින සිට අනුමත කරන ලද මධ්‍යම පළාත් ගුරුමාරු ප්‍රතිපත්තිය අනුව මෙවර ගුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ගුරු මාරු මණ්ඩල නිර්දේශ සහිතව ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කර සිටිමි.

1. 2026/2027 වර්ෂයට අදාල ගුරු මාරු මණ්ඩල ස්ථාපනය කිරීම සඳහා අදාළ වෘත්තිය සමිති නියෝජිත නාම ලේඛන ලැබෙන පරිදි ඔබ වෙත යොමු කරමි. එතෙක් 2025/2026 වර්ෂය සඳහා පත් කර ඇති කලාප ගුරු මාරු මණ්ඩල නියෝජිතයින් මේ සඳහා යොදවා ගන්නා ලෙස දන්වා සිටිමි.
2. අන්තර් පළාත් සඳහා ගුරු සේවයේ ස්ථාන මාරුවීම්වලට අදාලව **(2019 වර්ෂයේ සිට කලාපය තුළ සහ අන්තර් කලාප ස්ථාන මාරුවීම් අන්තර්ජාලය හරහා පමණක් සිදු කරන බව කාරුණිකව සලකන්න. විස්තර හා උපදෙස් ඇතුළත් ඇමුණුම මේ සමඟ එවා ඇත.)** මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2027 වර්ෂයට සකස් කොට ඇති ගුරු මාරු ඉල්ලුම් පත්‍රය පමණක් භාවිතා කිරීමට සහ ජාතික පාසල් සඳහා ඉල්ලුම් කිරීමේ දී මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති 2027 වර්ෂයට අදාළ ඉල්ලුම්පත්‍රය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2020(1) හි විධිවිධාන අනුව අවශ්‍යතා සම්පූර්ණ කරන බවට තහවුරු කර ගැනීම සඳහා අන්තර්ග්‍රහණය කිරීමේ නව අයදුම්පත්‍රයද ඉදිරිපත් කළ යුතු බවට විදුහල්පති මඟින් ගුරුවරුන් දැනුවත් කළ යුතුය. බස්නාහිර පළාත් සභාව වෙත ඉල්ලුම් කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/91 අනුව ආකෘති පත්‍රය සහ එයට අදාළව ඉදිරිපත්කළ යුතු ලේඛන නිසි පරිදි සම්පූර්ණ කර ලබාගත යුතු අතර ඒ සමඟ මෙම දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති 2027 වර්ෂයට අදාළ අයදුම්පත්‍රයද විධිමත් ආකාරයට සම්පූර්ණ කර ඉදිරිපත්කළ යුතු වේ. අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර ඔබ විසින් භාර නොගත යුතුය. (ආදර්ශ ඉල්ලුම් පත්‍රය ඔබ වෙත එවා ඇත.) ඔබ වෙත ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රවල දින මුද්‍රාව මත අත්සන් තබා කලාප ගුරු මාරු මණ්ඩලය වෙත යොමු කළ යුතුය. කලාප ගුරු මාරු මණ්ඩලය කැඳවා ඉල්ලුම් පත්‍ර පිළිබඳව සාකච්ඡා කොට ගන්නා ලද තීරණ ගුරු මාරු මණ්ඩලයේ නියෝජිතයන්ගේ අත්සන් සහිතව සියලුම ඉල්ලුම් පත්‍ර මධ්‍යම පළාත් ගුරු මාරු මණ්ඩලය වෙත **2026.08.16 දිනට පෙර** එවිය යුතුය.

   කලාපය තුළ හා අන්තර් කලාප ස්ථාන මාරු සම්බන්ධ කටයුතු අන්තර්ජාලය හරහා සිදුකළ යුතුය. අන්තර් කලාප ස්ථාන මාරු සඳහා කලාප මාරු මණ්ඩල තීරණ **2026-08-16 ට පෙර අන්තර්ජාලයට ඇතුළත් කර අවසන් කළ යුතුය.**
3. 2027 වර්ෂය සඳහා ගුරු සේවයේ අන්තර් පළාත්/ජාතික පාසල් ස්ථාන මාරු ඉල්ලුම් පත්‍ර 2026 ජූනි මස 30 දිනට පෙර කලාප අධ්‍යාපන කාර්යාලයට ගෙන්වා ගත යුතුය.

02 වන පිටුවට.......

එම අයදුම්පත් භාරගැනීමේදී පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස දන්වමි.

- ගුරුභවතුන් විසින් සේවා විස්තර සහ අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ කිරීමේදි දත්ත නිවැරදිව ඇතුලත් නොකරන බවට කරුණු අනාවරණය වන බැවින් මේ සම්බන්ධව ඔබගේ විශේෂ අවධානයක් යොමු කළ යුතුය.
- බස්නාහිර පළාත සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී විවාහ සහතිකයේ පිටපත් 05 ක් ද, බස්නාහිර පළාත තුළ කලත්‍රයා වසර 03 කට වඩා පදිංචි බවට ග්‍රාම නිළධාරී සහතික පිටපත් 05 ක් ද, ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත්‍ර 25/91 සහ එයට අදාළව ඉදිරිපත්කළ යුතු ලේඛන අමුණා තිබිය යුතුය.
- අන්තර් පළාත්/ජාතික පාසල්වල සියලුම ඉල්ලුම්පත්‍රවල ගුරුවරයාට එරෙහිව විනය පරීක්ෂණයක් හෝ විගණන විමසුමක් පැවැත්වෙන්නේ ද/නැද්ද යන්න පිළිබඳව පැහැදිලිව සඳහන් කළ යුතුය

අන්තර් පළාත් සහ ජාතික පාසල් ගුරු සේවයේ ස්ථාන මාරු සඳහා මේ සමඟ අමුණා ඇති ඇමුණුමේ සඳහන් නිර්ණායක (ඇමුණුම 01) පදනම් කරගත යුතු අතර, පිරික්සුම් ලැයිස්තුවේ (ඇමුණුම 02) සඳහන් පරිදි ලේඛන ලබාගෙන විධිමත් පරිදි මා වෙත අදාළ කාල වකවානුව තුළ ඉදිරිපත් කළ යුතුය.

<u>උපදෙස් :- ජාතික පාසල් හා අන්තර් පළාත් ගුරු සේවයේ ස්ථාන මාරු සඳහා</u>

කලාප ගුරු මාරු මණ්ඩල නියෝජිතයන් ඉල්ලුම්පත්‍රවල අදාළ ස්ථානයේ අත්සන තබා තිබිය යුතුය. ඔබ කලාපයේ ගුරු මාරු මණ්ඩල නියෝජිතයන්ගේ නාම ලේඛනයක් සකසා, නම ඉදිරියේ ඔවුන්ගේ ආදර්ශ අත්සන තබා ඔබ විසින් සහතික කොට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට එවන ඉල්ලුම්පත්‍ර කට්ටලය සමග එවිය යුතුය.

01. ගුරු මාරු මණ්ඩල නිර්දේශය මා වෙත එවීමේදී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ හෝ ඔහු විසින් බලය පැවරූ නිළධාරියෙකුගේ නිශ්චිත නිර්දේශය සමග අත්සන හා නිල මුද්‍රාව අනිවාර්යයෙන් යෙදිය යුතුය. යමෙකුට බලය පවරා ඇත්නම්, එම බලය පැවරූ ලිපියේ පිටපතක් ද මා වෙත එවීමට කටයුතු කරන්න.

02. සියලුම කලාපවල ද්‍රවිඩ මාධ්‍ය ගුරු මාරු ඉල්ලුම්පත්‍ර සලකා බැලීම සඳහා ද්‍රවිඩ මාධ්‍ය අධ්‍යක්ෂවරයෙකුගේ සහ දෙමළ මාධ්‍ය ගුරු මාරු නියෝජිතයන්ගේ සහාය ගුරු මාරු මණ්ඩලය විසින් ලබා ගත යුතුය.

03. කලාප ගුරු මාරු මණ්ඩල සංයුතිය
    - I. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරන නිලධාරියෙක් (සභාපති)
    - II. කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරු ස්ථාන මාරු සම්බන්ධව කටයුතු කරන විධායක/මාණ්ඩලික නිලධාරියා
      තනතුරු පුරප්පාඩු වී ඇති විට එම රාජකාරී ඉටුකරන අනුප්‍රාප්තික නිලධාරියා ඒ වෙනුවට පත්කළ යුතුය
    - III. විෂයභාර අධ්‍යක්ෂවරයෙක්
    - IV. ගුරු සේවයේ නියුක්ත මුළු නිලධාරි සංඛ්‍යාවෙන් 15% ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින එම සේවාවට අදාළ එක් එක් වෘත්තීය සංගමයෙන්
      හෝ
      පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදාහැර ඇති එක් එක් වෘත්තීය සංගමයේ
      හෝ
      නියෝජිතයෙක් බැගින්

03 වන පිටුවට ........

ගුරු මාරු ක්‍රියාත්මක කිරීමට අදාළ කාල රාමුව

| අනු අංකය | ක්‍රියාවලිය | කාල රාමුව |
|---|---|---|
| 01 | ගුරු ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම | 2026.06.15 – 2026.06.30 |
| 02 | අන්තර් කලාප, අන්තර් පළාත්, හා ජාතික පාසල් ගුරු මාරු ඉල්ලුම්පත් සම්බන්ධව තීරණ ගැනීම සඳහා කලාප ගුරු මාරු මණ්ඩල රැස්වීම් පැවැත්වීම | 2026.07.01 – 2026.08.15 |
| 03 | අන්තර් කලාප, අන්තර් පළාත් හා ජාතික පාසල් ගුරු මාරු ඉල්ලුම්පත් සම්බන්ධව තීරණ ගැනීම සඳහා පළාත් ගුරු මාරු මණ්ඩල රැස්වීම් පැවැත්වීම | 2026.08.17 – 2026.09.15 |
| 04 | අන්තර් පළාත් හා ජාතික පාසල් ගුරුමාරු ඉල්ලුම්පත් පිළිබඳව නිර්දේශ ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම හා අන්තර් කලාප ස්ථාන මාරු සඳහා අනුප්‍රාප්තිකයෙක් රහිතව නිදහස් කරන ලද ගුරුභවතුන්ගේ නාම ලේඛන කලාපවලට යොමු කිරීම | 2026.09.16 – 2026.09.30 |
| 05 | අනුප්‍රාප්තිකයෙක් රහිතව කලාපයට නිදහස් වී ඇති ගුරුභවතුන් ස්ථානගත කිරීම හා කලාපය තුළ ස්ථාන මාරු කිරීමට නියමිත ගුරුභවතුන් ස්ථාන මාරු කිරීම සඳහා කලාප ගුරු මාරු මාරු මණ්ඩල රැස්වීම් පැවැත්වීම | 2026.10.01 – 2026.11.02 |
| 06 | ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය 2026.12.16 ලෙස යොදා ස්ථාන ගත කිරීමේ ලිපි අදාල ගුරුභවතුන් වෙත යොමු කිරීම | 2026.11.03– 2026.11.16 |
| 07 | ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා භාර ගැනීම | 2026.11.17 – 2026.11.30 |
| 08 | අභියාචනා මණ්ඩල පැවැත්වීම හා එම තීරණ ගුරුභවතුන් වෙත දැනුම් දීම | 2026.12.01 – 2026.12.14 |

**ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුය.**

01. අන්තර් කලාප/අන්තර් පළාත් ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලබන අය

I. පත්වීම් ලිපියේ කොන්දේසි අනුව අදාල කලාපයේ සිටිය යුතු අනිවාර්ය සේවා කාලය අසම්පූර්ණ සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කළ යුතුය. වෙනත් කලාපවලට අනුයුක්තව සේවය කර ඇත්නම් හෝ කරන්නේ නම් ඒ බව ද ඉල්ලුම්පත්‍රයේ සඳහන් කළ යුතුය. නිවැරදි සේවා කාලය සම්පූර්ණ කර ඇත්දැයි මෙහිදී පරික්ෂා කිරීම වැදගත් වේ.
(අතිරික්ත ගුරු සංඛ්‍යාව කලාපය තුළ තුලනය කිරීම පළමුව සිදු කිරීම වඩා සුදුසුය.)

II. 2027 වසර සඳහා ස්ථාන මාරුවීම් සිදු කිරීමේ දී ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව පත්වීම් කොන්දේසි සම්පූර්ණ කර තිබිය යුතු අතර සේවා කාලය 2026.01.01 දිනට බලපාන පරිදි ස්ථාන මාරු කළ යුතුය. (ස්ථානමාරු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ දී සේවා කාලය ගණනය කරනු ලබන්නේ 2026.01.01 දිනටය.)

02. මධ්‍යම පළාතේ ගුරු මාරු කිරීම පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සිදු කෙරේ.

I. ස්ථාන මාරු ඉල්ලීම සඳහා පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි සම්පූර්ණ විය යුතුය.

II. විනය හේතු මත ස්ථාන මාරු කර ඇති ගුරු භවතුන් ස්ථාන මාරු සඳහා සුදුසුකම් නොලබනු ඇත.

III. අන්තර් පළාත් ස්ථාන මාරු සඳහා අවම වශයෙන් මධ්‍යම පළාතේ අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. ගුරු මාරු ඉල්ලුම්පත් ඉදිරිපත් නොකළ ද ගුරු අතිරික්තයක් ඇති පාසල්වල ගුරුවරු ගුරු ඌණතා ඇති පාසල්වලට ස්ථානමාරු කළ යුතුය. දුෂ්කර සේවය නොකළ ගුරු භවතුන් 2027-01-01 දින සිට දුෂ්කර පාසල්වලට ස්ථාන ගත කළ යුතුය.

IV. අන්තර් කලාප හා අන්තර් පළාත්වල සමාන පත්වීම් සුදුසුකම් ඇති ගුරු භවතුන් අතර සුහද ස්ථාන මාරු සඳහා විදුහල්පති හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය මත ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

V. එක් ගුරුභවතකුට අයදුම් කළ හැක්කේ අන්තර් පළාත්, ජාතික පාසල්, අන්තර් කලාප සහ කලාපය ඇතුලත ස්ථාන මාරු වර්ග 04 න් එක් ස්ථාන මාරු වර්ගයක් පමණි.

04 වන පිටුවට.........

03.ගුරු සේවයේ සෑම ස්ථාන මාරුවක් තුළින්ම සිසුන්ගේ ඉගෙනුමට බාධාවක් ඇති නොවනසේ අදාළ විෂයයන්වලට ගුරුවරයෙකු ලබා දීමෙන් පසුව ස්ථාන මාරුව ලබා දිය යුතුය. නව සේවා ස්ථානයේ අවම වශයෙන් කාල ඡේද 30 ක් වත් ලබා දීමට නොහැකි අවස්ථාවල දී ස්ථාන මාරුව ලබා නොදිය යුතුය.

04.ස්ථාන මාරුවක් ලබා පූර්ව සේවා ස්ථානයේ රාජකාරි බඩු බාහිරාදිය භාර දී නිදහස් වී ඇත්නම් පමණක් නව සේවා ස්ථානයේ රාජකාරි භාර දිය යුතු බවත්, නොඑසේ නම්, රාජකාරි භාර නොදිය යුතු බවත් විදුහල්පතිවරුන් දැනුවත් කර තිබීම ඔබගේ වගකීම වේ.

ඩී.එම්.එම්.පී.දිසානායක
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන)
මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මහනුවර.

ඩී.එම්.එම්.පී.දිසානායක,
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

පිටපත් :-

01. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා :- කා.දැ.ස.
02. ලේකම්, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය :- කා.දැ.ස

| | එකඟතාවය ලබා දී ඇති පොදු නිර්ණායක |
|---|---|
| 01 | පළාත තුල පදිංචිය<br>ස්ථාන මාරුව ඉල්ලුම්කරන පළාත් තුළ ස්ථිර පදිංචිය සහිත බව තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය (DS 04) අයදුම්කරුවන්ගෙන් ලබාගැනීම |
| 02 | අන්තර් පළාත් ස්ථාන මාරුව ලබාගැනීමෙන් පසු ස්ථාන මාරුව ලබාගන්නා පළාත තුළ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කල යුතුය යන කොන්දේසියට යටත් විය යුතුය. |
| 03 | ස්ථාන මාරු අපේක්ෂිත තනතුර අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත්ව තිබීම හා එහි පුරප්පාඩු පැවතීම |
| 04 | සේවය ස්ථිර කර තිබීම<br>සේවය ස්ථිර කර නොමැති ස්ථාන මාරු අපේක්ෂිත නිලධාරීන් විසින් දැනට පළාත් සභාවේ අදාළ තනතුරට බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් සනාථ කරන ලියවිලි ඉදිරිපත්කල යුතුය. |
| 05 | අදාළ තනතුරේ නියමිත ශ්‍රේණියෙහි ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අවසානයේ තැබීමේ කොන්දේසියට යටත්ව පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමට නිලධාරියා විසින් කැමැත්ත පළකර තිබීම. ( මධ්‍යම රජය මඟින් බඳවාගෙන පළාත් සභාවට අනුයුක්ත කරනු ලබන තනතුරුවල නිලධාරීන් ජ්‍යෙෂ්ඨත්වයෙන් අගට තැබීම සිදුකළ යුතු නොවන අතර, එම නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය සලකා බලා අදාල ස්ථානයේ තැබිය යුතුය.) |
| 06 | පූර්ව සේවා කාලය තුලදී වසර 03 ක් ඇතුළත වැටුප් රහිත නිවාඩු ලබා නොතිබිය යුතුය. මෙම කරුණ සනාථ කරගැනීම සඳහා ස්ථාන මාරු අයදුම් කරන දිනට පූර්වාසන්න වසර 03 ක ( පවත්නා වර්ෂයද ඇතුළත්ව) නිවාඩු වාර්තාවක් ආයතන ප්‍රධානී නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය. |
| 07 | නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර හෝ ආරම්භ කිරීමට සූදානමක් හෝ නොමැති විය යුතුය. නිලධාරියාට එරෙහිව විනය කටයුතු ඇති/නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී මඟින් සහතිකයක් ලබාගැනීම |
| 08 | අදාළ පළාත් සභාවේ සේවා කාලය තුළදී ඊට අදාළ වන කිසියම් කරුණක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයක් එම නිලධාරියාට එරෙහිව නොපවතින බවට ආයතන ප්‍රධානී නිර්දේශය සහිතව ඉදිරිපත් කළයුතුය. |
| 09 | නිලධාරියාට එරෙහිව බරපතල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව විගණන විමසුම් ඇති/නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී සහතිකයක් ලබාගැනීම |
| 10 | අදාළ නිලධාරියා පළාත් සභාවේ වියදමෙන් විශේෂ පුහුණුවක් ලබා තිබේ නම් , පුහුණුවට අදාල ගිවිසුම්ගත අනිවාර්යය සේවා කාලය ඉකුත්වී තිබීම හෝ කිසියම් බැඳුම්කරයකට යටත්කොට තිබී බැඳුම්කරයෙන් නිදහස් වී තිබීම. මෙම කරුණ සනාථ කර ගැනීම සඳහා ආයතන ප්‍රධානියා වෙතින් සහතිකයක් ලබාගැනීම |
| 11 | නිලධාරියාගෙන් පළාත් සභාවට අයවිය යුතු ණය ශේෂයක් තිබේ නම්, එම මුදල ස්ථාන මාරුවීමට අපේක්ෂිත ආයතනයෙන් එකවර ගෙවන බවට සහතිකයක් තිබිය යුතුය. මෙම කරුණ සඳහා ස්ථාන මාරු අයදුම්කරුගෙන් පළාත් සභාවට අයවිය යුතු ණය ශේෂයන් පිළිබඳ වාර්තාවක් අදාළ ආයතන ප්‍රධානියා විසින් අයදුම්කරුගේ අයදුම්පත සමඟ අමුණා එවිය යුතු අතර, අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා විසින් නිර්දේශ ලබාගන්නා අවස්ථාවේ ස්ථාන මාරු වීමට අපේක්ෂිත ආයතනයෙන් එම මුදල එකවර ගෙවන බවට එකඟතාවය ලිඛිතව ලබාගැනීම |

ඇමුණුම 02

## පිරික්සුම් ලැයිස්තුව

**ජාතික පාසල් හා අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු අයදුම්පත සමඟ මෙම පිරික්සුම් ලැයිස්තුව සම්පූර්ණ කර අමුණා එවීම අනිවාර්යය වේ.**

| | අවශ්‍ය ලේඛන | ඉදිරිපත් කළ යුතු සංඛ්‍යාව | ඇමුණුම ඇත/නැත |
|---|---|---|---|
| 01 | විධිමත්ව සම්පූර්ණ කළ හා නිර්දේශ සහිත ස්ථාන මාරු අයදුම්පත ( ජාතික පාසල් සේවයට අයදුම් කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2020(1) හි විධිවිධාන අනුව අවශ්‍යතා සම්පූර්ණ කරන බවට තහවුරු කර ගැනීම සඳහා අන්තර්ග්‍රහණය කිරීමේ නව අයදුම්පත්‍රය ද ඉදිරිපත් කළ යුතුය) | මුල් පිටපත් 05 ක් සමඟ ඡායා පිටපත් 01 ක් | |
| 02 | ස්ථාන මාරු වී යන පළාත තුළ ස්ථිර පදිංචිය සහිත බව තහවුරු කිරීම සඳහා ග්‍රාම නිළධාරී සහතිකය( DS 04) | මුල් පිටපත, සහතික කරන ලද පිටපත් 01 බැගින් | |
| 03 | අන්තර් පළාත් ස්ථාන මාරුව ලබාගැනීමෙන් පසු ඒ පළාත් සභාව තුළ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරන බවට එකඟතාවය | මුල් පිටපත, සහතික කරන ලද පිටපත් 01 බැගින්(දිවුරුම් ප්‍රකාශයක්) | |
| 04 | ස්ථාන මාරු වී යන පළාතේ පුරප්පාඩු සහිත ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට කැමැත්ත ප්‍රකාශිත ලිපිය | මුල් පිටපත, සහතික කරන ලද පිටපත් 01 බැගින්(දිවුරුම් ප්‍රකාශයක්) | |
| 05 | සේවය ස්ථිර කිරීමේ ලිපිය | සහතික කරන ලද පිටපත් 02 ක් | |
| | සේවය ස්ථිර කර නොමැති නම් , බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බව සනාථ කරන අධ්‍යාපන සහතිකවල විභාග කොමසාරිස් ජනරාල් විසින්/විශ්වවිද්‍යාල ලේඛකාධිකාරී විසින් සනාථ කරන ලද පහත සඳහන් ලියවිලි<br>▪ අ.පො.ස. (සා.පෙ.) හා අ.පො.ස.(උ.පෙ.) විභාග ප්‍රතිඵල සටහන්<br>▪ උපාධි සහතිකය/විද්‍යාපීඨ සහතිකය/පුහුණු සහතිකය/ඩිප්ලෝමා සහතිකය සනාථ කිරීමේ ලිපියේ පිටපතක්<br>▪ වැඩ භාරගැනීමේ ලිපියේ පිටපතක් | සහතික කරන ලද පිටපත් 02 ක් | |
| 06 | පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධරයන් අදාළ තනතුරේ නියමිත ශ්‍රේණියෙහි ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අවසානයේ තැබීමේ කොන්දේසියට යටත්ව ස්ථාන මාරු වී යන පළාතේ පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළකල ලිපිය, ( මධ්‍යම රජය මඟින් බඳවාගෙන පළාත් සභාවට අනුයුක්ත කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අවසානයේ තැබීමේ කොන්දේසිය අදාල නොවේ) | මුල් පිටපත, සමඟ සහතික කරන ලද පිටපත් 01 බැගින්(දිවුරුම් ප්‍රකාශයක් මඟින්) | |